ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# ලියාපදිංචි විදේශ රැකියා ඒජන්සි/බලපත්‍රලාභීන්

සඳහා

සදාචාරාත්මක චර්යා පිළිබඳ

ව්‍යවස්ථා සංග්‍රහය

# ලියාපදිංචි විදේශ රැකියා ඒජන්සි / බලපත්‍රලාභීන්

## සඳහා සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

මෙම වාර්තාව සකස් කිරීමේදී තාක්ෂණික සහය ලබා දෙන ලද්දේ
ශ්‍රී ලංකාව සහ මාලදිවයින වෙනුවෙන් පිහිටි ILO දේශීය කාර්යාලය විසිනි.

2013 නොවැම්බර්

# පෙරවදන

ශ්‍රී ලංකාවේ ශ්‍රමිකයන් බඳවා ගැනීමේ කර්මාන්තය රටෙහි ශ්‍රම සංක්‍රමණ අංශයෙහි ප්‍රධාන භූමිකාවක නිරත වෙයි. අනතුරුවලින් තොරල ස්ථිර මෙන්ම ගරුත්වය රැකෙන සේවා තත්ත්වයන් තුළ ශ්‍රී ලාංකිකයින්ට රැකියා සපයා දීම කර්මාන්තයෙන් අපේක්ෂා කරන අතර, ශ්‍රී ලංකාව තු, හා සේවයට යන රටවල දී සංක්‍රමණික ශ්‍රමිකයින් අපයෝජනයට හා සූරාකෑමට ලක්වීමේ අවස්ථාවන් අවම කරගනු පිණිස කර්මාන්තයට නීතිමය පාලනයක් අවශ්‍ය වේ. සංක්‍රමණික ශ්‍රමිකයින් ආරක්ෂා කිරීමෙහි ලා අධිකාරය ලත් රාජ්‍ය ආයතනය ලෙස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් එහි ලියාපදිංචි වී ඇති 700 ක් ඉක්ම වූ බලපත්‍රලාභී බඳවා ගැනීමේ ඒජන්සි නීතිමය පාලනයක් යටතට ගෙන ඒමේ උත්සාහයන් කීපයක් ගනිමින් සිටී.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහාය ඇතිව විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා ශ්‍රී ලංකා රජය විසින් ජාතික ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවනු ලැබේ. "ශ්‍රම සංක්‍රමණ ක්‍රියාවලියෙහි බඳවා ගැනීම පිළිබඳ අංශය යහපාලනය, බලපත්‍ර නිකුත් කිරීමේ යෝජනා ක්‍රම, චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහ, නියාමනය සහ නීතිවිරෝධී ක්‍රියාකාරකම් ආමන්ත්‍රණය සඳහා නෛතික ප්‍රතිපාදන මාර්ගයෙන් රජය විසින් ශ්‍රමිකයන් බඳවා ගැනීමේ කර්මාන්තය පාලනය කෙරෙනු ඇත" යනුවෙන් ප්‍රතිපත්තිය පැහැදිලිව දක්වා ඇත.

මෙය ඉටුකරගනු පිණිස, "සංක්‍රමණික ශ්‍රමිකයින් යහපාලනය, ආරක්ෂාව සහ බලසතු කිරීම තුලින් යහපත් රැකියා ප්‍රවර්ධනයට ශ්‍රී ලංකා ජාතික ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්තිය ඵලදායීව ක්‍රියාවට නැගීම සහතිකවීම" නම් ව්‍යාපෘතිය මගින් බඳවා ගැනීමේ කර්මාන්තය පාලනය කිරීම සඳහා නිර්දේශ හා මාර්ගෝපදේශයන් සකසා ගැනීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට සහායවීම වෙනුවෙන් ජාත්‍යන්තර කම්කරු සංවිධානය ක්‍රියාකාරකම් කිහිපයක නිරත වෙමින් සිටී.

2011 නොවැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාව තුළ හා විදේශයන්හි පවත්නා බඳවා ගැනීමේ ක්‍රමවේදයන් සම්බන්ධ අධ්‍යයනයක් සඳහා ව්‍යාපෘතිය මගින් කටයුතු යොදන ලදී. ක්‍රියාත්මකව පවත්නා විශේෂිත බඳවා ගැනීමේ ක්‍රමවේදයන් මෙම සමාලෝචනය මගින් ඉස්මතු වූ අතර, ඒවා වැඩිදියුණු කර ගැනීම පිණිස නිර්දේශයන් ඉදිරිපත් විය. ආසියා පැසිෆික් කලාපය තුළ බඳවා ගැනීමේ කර්මාන්තයෙහි යහපුරුදු විශ්ලේෂණය වෙනුවෙන් ප්‍රකාශයට පත්ව ඇති තොරතුරු අධ්‍යයනයක් ද කරන ලදී. සමාලෝචනයෙන් සහ තොරතුරු අධ්‍යයනයෙන් සොයාගත් කරුණු භුවමාරුකරගැනීමට ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් 2012 අප්‍රේල් මාසයේ ජාතික පාර්ශවකරුවන්ගේ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. එහි මුලසුන විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශයේ ලේකම් විසින් දරන්නට යෙදිණ. කම්කරු හා කම්කරු සබඳතා

අමාත්‍යාංශයල විදේශ කටයුතු අමාත්‍යාංශය, තනි තනි බඳවා ගැනීමේ ඒජන්සි, ලියාපදිංචි විදේශ රැකියා ඒජන්සි සංගමය, වෘත්තීය සමිති සහ සිවිල් සමාජ නියෝජිතයින් මෙම වැඩමුළුවට සහභාගි වූහ. නිර්දේශයන් සමාලෝචනය කළ සහභාගි වූවන් විසින් ශ්‍රී ලංකාවේ ශ්‍රමිකයන් බඳවා ගැනීමේ කර්මාන්තය සඳහා සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයක් සකස් කිරීම සම්බන්ධයෙන් එකඟතාවය පළ කළහ. ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ බහුපාර්ශ්වික රාමුවෙහි දැක්වෙන ප්‍රතිපාදනයන් හා සැසඳෙන අයුරින් මෙන්ම ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන් ගේ ආරක්ෂාව සහ අයිතිවාසිකම් මෙරට හා ගමනාන්ත රටවල දී කර්මාන්තය කටයුතු කරනු ලැබීම සහතික කරනු පිණිස මෙය කරන ලදී. පාර්ශ්වකරුවන්ගේ වැඩමුළුවෙහි එක් මුඛ්‍ය ප්‍රතිඵලයක් වූයේ මුලසුන විසින් ශ්‍රමිකයින් බඳවා ගැනීමේ ඒජන්සි සඳහා සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයක් ගොඩනැගීම සඳහා මග පෙන්වීමට අනුකාරක කමිටුවක් පත්කරනු ලැබීම ය.

මෙම කමිටුවට විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඩී. ස්වර්ණපාල මහතා, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සම්බන්ධීකරණ ලේකම් පී. රත්නායක මහත්මිය, විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශයේ වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්, ඩබ්ලිව්. එන්. එස්. බණ්ඩාර මහතා, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අතිරේක සාමාන්‍යාධිකාරී කේ. ඩී. ඩී. ප්‍රනාන්දු මහතා, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) චේකා ප්‍රේමසිරි මහත්මිය, ලියාපදිංචි විදේශ රැකියා ඒජන්සි සංගමයේ සභාපති ඩබ්ලිව්. එම්. අපොන්සු මහතා, ලියාපදිංචි විදේශ රැකියා ඒජන්සි සංගමයේ ලේකම් ෆායිසර් මකීන් මහතා, ලංකා සේවක සංගමයේ උප සභාපති කේ. මාරිමුත්තු මහතා සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ උපදේශක එල්. කේ. රුහුණුගේ මහතා යන මහත්ම මහත්මීන් ඇතුළත් විය.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ආයතනික නෛතික රාමුවට අනුකූලව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සාමාන්‍යාධිකාරී එච්. බටගොඩ මහතා, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කළමනාකරු (නීති) එම්. එම්. සන්ධ්‍යා ස්වීටි මහත්මිය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහකාර කළමනාකරු (නීති) ආර්. ඒ. ජී. එස්. ජයසිංහ මහතා යන මහත්ම මහත්මීන්ගේ යෙදවුම් ද සහිතව ශ්‍රමිකයින් බඳවා ගැනීමේ ඒජන්සි සඳහා සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය ගොඩනගන ලදී. මෙම ලේඛනය සකස් කිරීමේ සමස්ථ ක්‍රියාවලිය තුළ පද්මිණී රත්නායක මහත්මිය සහ එල්. කේ. රුහුණුගේ මහතා විසින් සිය වෘත්තීය දායකත්වය ලබා දෙමින් ගත් වෑයම සම්බන්ධයෙන් ඔවුන්ට ස්තූතිය හිමිවේ.

2013 අගෝස්තු මාසයේ දී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයට අනුමැතිය දෙන ලද අතර, වෘත්තීය මට්ටම, වගකීම හා වගවීම, සහ ව්‍යාපාරික කටයුතුවල විනිවිදභාවය නංවමින් ශ්‍රමිකයින් බඳවා ගැනීමේ නියෝජිතවරුන්ගේ පරිචයන් අනාකූල තත්ත්වයකට ගෙන ඒමේ අදහසින් මෙම සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය ගොඩනගන්නට යෙදුණි. සංක්‍රමණය වන ශ්‍රී ලාංකීය ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට ආරක්ෂිත හා ස්ථිර රැකියා ලැබීම සහතික කර ගනු පිණිස මෙම සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ දක්වා ඇති මූලධර්මයන් අනුගමනය කිරීම, බඳවා ගැනීමේ කටයුතුවල නියුක්ත පාර්ශ්වයන්ගේ යුතුකම වේ.

# පටුන

අර්ථ දැක්වීම 3

1. හැඳින්වීම 4

    1.1 අරමුණ 4

    1.2 නිල නාමය 4

    1.3 අධිකාරය 5

2. නෛතික අවනතභාවය 5

3. ව්‍යාපාරික ප්‍රමිති 5

4. රැකියා පිළිබඳ වෙළඳ දැන්වීම් 6

5. බඳවා ගැනීම 6

6. ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව හා සුභසාධනය 8

7. පුහුණුව 8

8. පැමිණිලි ගැන කටයුතු කිරීම හා ආරාවුල් නිරාකරණය 10

9. සේවාදායකයන්ට හා රැකියා සොයන්නන්ට ඇති වගකීම හා පාරිභෝගික සත්කාරය 10

10. හවුල් ගොඩනැගීම 11

11. ආපසු පැමිණීම හා නැවත ප්‍රජාවට එකතු වීම 11

12. සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය ගැන දැනුවත් වීම 12

13. සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක කිරීම 12

14. බලය පැවැත්වීම 13

15. පැමිණිලි ඉදිරිපත් කිරීමේ කාල සීමාව 13

## අර්ථ දැක්වීම්

i. **මානව වෙළෙඳාම** වනාහි බලයෙන් හෝ අනිවාර්ය ලෙස ශ්‍රමය හෝ සේවා ලබාගැනීම, වහල්භාවයට පත්කිරීම, පරිවසභාවයට පත්කිරීම, ඉන්ද්‍රිය ඉවත් කිරීම හෝ (දණ්ඩ නීති සංග්‍රහයේ S. 360C ඡේදයේ විස්තර වන ආකාරයට) මොනම නීතියක් යටතේ හෝ නීති විරෝධී ක්‍රියාවක් ලෙස සැලකෙන ලිංගික සූරාකෑමකට හෝ වෙනත් ආකාරයක ක්‍රියාකාරකමක් සඳහා තර්ජනය, බලය, වංචාව, රැවටීම හෝ පෙළඹවීම හෝ අනෙකෙකුගේ අසරණභාවය උපයෝගි කර ගනිමින් බඳවාගැනීම, ප්‍රවාහනය, පවරාදීම, රඳවා තබා ගැනීම හෝ වෙනත් ක්‍රියාවක් සඳහා මුදලට හෝ වෙනත් ප්‍රතිෂ්ඨාවකට ඕනෑම කෙනෙකු මිලට ගැනීම, විකිණීම හෝ හුවමාරු සඳහා ප්‍රවර්ධනය, පහසුකම් සැලසීම හෝ වෙනත් පුද්ගලයෙකු පෙළඹවීමයි.

ii. **මානවයන් හොරෙන් ප්‍රවාහනය** වනාහි සෘජුව හෝ වක්‍රව මුදල් හෝ වෙනත් ද්‍රව්‍යමය වාසි ලබා ගැනීම උදෙසා / යම් රටක රට වැසියකු නොවන හෝ ස්ථිර පදිංචිකරුවකු නොවන පුද්ගලයෙකුට නීති විරෝධීව එම රටට ඇතුල්වීමට කටයුතු සැලසීමය. නෛතික සීමාවන් හා නෛතික මාර්ග යන් පිළිබඳව දැනීමක් නොමැතිකම නිසා නිදහසේ දේශසීමා හරහා රටකට ඇතුල්විය නොහැකි විට සංක්‍රමණිකයන් විසින් අදාළ රටට ඇතුල්වීම සඳහා නීති විරෝධී ප්‍රවාහකයින්ට ගෙවීමක් කිරීම මගින් තම අවශ්‍යතාවය ඉටුකරගනු ලැබේ.

iii. **බලයෙන් වැඩ ගැනීම** යන්නෙන් (දණ්ඩ නීති සංග්‍රහයේ විස්තර වන ආකාරයට) ස්ත්‍රියක / පුරුෂයෙකු විසින් ස්වෙච්ඡාවෙන් ඉටු නොකරන එහෙත් දඬුවම් කරන බවට තර්ජනය කිරීම මගින් ලබාගන්නා සියලුම වැඩ සහ සේවාවන් අදහස් වෙයි.

iv. **ළමා ශ්‍රමය** වනාහි ළමුන්ට සිය ළමා විය ද, ඔවුන්ගේ විභවය ද, අභිමානය ද අහිමි කරන, ඔවුන්ගේ ශාරීරික හා මානසික වර්ධනයට හානිකර වැඩ කොටස් ය. මින් අදහස් වන්නේ ළමුන්ට ශාරීරික මානසික සමාජයීය හා සදාචාරාත්මක අන්තරාදායක සහ හානිකර මෙන්ම නියමිත කාලයට පෙර ඔවුන්ට පාසලෙන් ඉවත්වීමට සිදුවීමෙන් අධ්‍යාපනයට ඇති අවස්ථාව අහිමි කරවන වැඩ යන එසේ නැතහොත් පාසල් යාම සමග දිගු වේලාවක් අධික ලෙස බර වැඩෙහි යෙදීම ගලපා ගැනීමට සිදුවන වැඩ ය. (ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිර්වචනය).

v. **රැකියා සොයන්නා** වනාහි විදේශ සේවා නියුක්තිය සොයන ශ්‍රී ලාංකිකයෙකි.

# 1. හැඳින්වීම

විවිධ විදේශීය රටවල රැකියා සඳහා ශ්‍රී ලාංකිකයන් තෝරා යැවීමේ දී, ලියාපදිංචි විදේශ රැකියා ඒජන්තවරුන් ගේ භූමිකාව පැහැදිලිව පෙනෙන්නට තිබේ. රටෙහි සේවා වියුක්තිය හා ඌන සේවා නියුක්තිය අඩු කිරීමෙහි ලා ඔවුන්ගේ වටිනා සේවාව රැකුලක් වනවා මෙන්ම, වර්තමානයේ විදේශ විනිමය ඉපයීමෙහි ඉහළම මාර්ගය බවට පත්ව ඇති විදේශ සේවා නියුක්තිය මගින් විදේශ විනිමය ඉපැයීම ජාතික ආර්ථිකය සරුකිරීමද වැදගත් වේ.

ලියාපදිංචි විදේශ රැකියා ඒජන්තවරුන් මගින් ඉටු කරන වැදගත් සේවාවන් ගැන කෘතඥ වෙමින්, 2008 දී එළිදක්වන්නට යෙදුන ජාතික ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්තිය මගින් ලියාපදිංචි විදේශ රැකියා ඒජන්තවරුන් අතර යහපත් සදාචාරාත්මක ක්‍රියාමාර්ගයන් වැඩිදියුණු කිරීමේ වැදගත්කම හඳුනා ගෙන ඇත. එහි අරමුණුවලට ලියාපදිංචි විදේශ රැකියා ඒජන්තවරුන්ගේ ව්‍යාපාරික ධාරිතාව ශක්තිමත් කිරීමත්, විදේශ සේවා නියුක්තිය සඳහා ශ්‍රමිකයන් බඳවා ගැනීමේ යහ පුරුදු ප්‍රවර්ධනය කර සංක්‍රමණික ශ්‍රමිකයින්ට, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට, රටෙහි ආර්ථිකයට හා සමස්ථ විදේශ රැකියා කර්මාන්තයට එම ප්‍රතිපත්තිවල වාසිය ලබාදීමත්ය.

කර්මාන්තය විධිමත් කිරීමේ අපේක්ෂාවෙන් මෙම සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය සකසන ලද්දේ විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරන ලද අනුකාරක කමිටුවක් විසිනි. එම අනුකාරක කමිටුව විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශයේ, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන්ගෙන් ද, වෘත්තීය සමිති නියෝජිතයන් ගෙන් ද, ලියාපදිංචි විදේශ රැකියා ඒජන්සි සංගමයේ නිලතල දරන්නන් ගෙන් ද සමන්විත විය. මෙම සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය සැකසීමේ දී ලියාපදිංචි විදේශ රැකියා ඒජන්සි සංගමයේ සහභාගිවීමෙන් සංකේතවත් වන්නේ වඩාත් ක්‍රමානුකූල හා විනිවිදභාවයෙන් යුක්ත ආකාරයකට සිය ශ්‍රමිකයින් බඳවා ගැනීමේ ව්‍යාපාරික කටයුතු කිරීම සඳහා මාර්ගෝපදේශයන් ස්ථාපිත කර ගැනීම උදෙසා බඳවා ගැනීමේ ඒජන්තවරු දක්වන උනන්දුවයි.

## 1.1 අරමුණු

මෙම සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය මගින් පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා රාමුවක් සකසා ගැනීමට අපේක්ෂිත ය.

I. රැකියා සොයන්නන්, සේවා යෝජකයන් හා වෙනත් අයවළුන් සමග ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු කරන ගනුදෙනුවල දී සදාචාරාත්මක චර්යාවන් හා වෘත්තීය නිපුණතාවන් ප්‍රවර්ධනය.

II. රැකියා සොයන්නන්ට හා සේවා යෝජකයන්ට ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු රැකියා සපයා දීමේ හා බඳවා ගැනීමේ සේවා සැපයීම සඳහා හොඳින් පාලනය වූ යහ පුරුදු රාමුවක් තුළට ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු ගෙන ඒම.

III. සංශෝධිත 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ යහපත් රැකියා න්‍යාය පත්‍රය හා ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් සමග සැසඳෙන සදාචාරාත්මක ප්‍රමිතීන් හා මාර්ගෝපදේශයන් ස්ථාපිත කරනු පිණිස ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරුන්ගේ ක්‍රියාකාරීත්වය පාලනය කිරීම.

IV. ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්ති කර්මාන්තයේ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සඳහා පාලනය අධිකාරිය හා සෙසු පාර්ශවකරුවන් සමග සුහද සම්බන්ධතාවයක් ගොඩනැගීම.

### 1.2 නිල නාමය

මෙම ව්‍යවස්ථා සංග්‍රහය "ලියාපදිංචි විදේශ රැකියා ඒජන්සි සඳහා සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය" ලෙස හැඳින්විය හැක.

### 1.3 අධිකාරය

සංශෝධනය කරන ලද 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත සහ 2008 දී පිළිගන්නා ලද ජාතික සංක්‍රමණික ශ්‍රම ප්‍රතිපත්තියේ නියමයන්ට අනුව මෙම සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය සම්පාදනය කරන ලදී. පාලන අධිකාරිය විසින් අනුමත කරන දිනයේ සිට සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය බලාත්මක වේ.

## 2. නෛතික අනුකූලතාවය

I. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් අනුමත කර ඇති පරිදි සියලුම ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් මෙම සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයෙහි දක්වා ඇති නියමයන් හා මාර්ගෝපදේශ වලට අවනතව කටයුතු කළ යුතු ය.

II. ඒ හැරුණ විට විදේශ සේවා නියුක්ති විෂයය කෙරෙහි බලපවත්වන දේශීය නීති ව්‍යවස්ථාවන්ගේ දක්වන නියෝගයන්ට සියලුම ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු අවනත විය යුතුවා මෙන්ම, ගරු කළ යුතු ය.

III. ශ්‍රී ලාංකීය සංක්‍රමණික ශ්‍රමිකයින් යවනු ලැබෙන ඕනෑම විදේශ රටක අදාළ නීතිවල දක්වා ඇති නියමයන්ට සියලුම ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු අවනත විය යුතු ය.

## 3. ව්‍යාපාරික ප්‍රමිති සහ යහපුරුදු

I. සංක්‍රමණික ශ්‍රමිකයින්, සේවා යෝජකයන් හා විදේශීය රැකියා ඒජන්තවරු සමග ගනුදෙනු කිරීමේදී ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් අවංකභාවය, වෘත්තීය නිපුණතාවය හා යහපුරුදු පිළිබඳ මූලධර්මයන් ඉහළම මට්ටමින් අනුගමනය කිරීම.

II. විදේශීය රැකියාවලට බඳවා ගැනීම සඳහා ඇති අවස්ථා භාර ගැනීමේ දී රැකියා සොයන්නන්ව විශේෂයෙන් කාන්තාවන්ව වෙනස් කොට සලකන හෝ ඔවුන්ට ඍණාත්මකව බලපාන හෝ මූලික

මානව අයිතිවාසිකම් උල්ලංඝණය වන සහ ජාතික හා ජාත්‍යන්තර සම්මතයන්ට පටහැනි ආකාරයට කටයුතු කිරීමෙන් වැළකීම.

III. මුදල් සහ/හෝ තත්ත්වය වෙනුවෙන් දුරාචාර, නීති විරෝධී හෝ අපත්තිදායක (unhealthy) තරඟයේ යෙදීමෙන් වැළකීම.

IV. පැහැදිලි හා විනිවිදභාවයෙන් යුතු ව්‍යාපාරික ප්‍රතිපත්ති තිබීම.

V. රැකියා සොයන්නන් සහ සංක්‍රමණික ශ්‍රමිකයින් හා හවුල්කරුවන් සමග ගනුදෙනු කිරීමේ දී විනිවිදභාවය හා වගවීම රැකෙනා අයුරු කටයුතු කිරීම.

VI. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් සපයන සේවාවන් වෙනුවෙන් රැකියා සොයන්නන්ගෙන් අයකර ගන්නා වූ සියලුම ආකාරවල ගාස්තු හා වියදම් පිළිබඳව නිවැරදි තොරතුරු රැකියා සොයන පුද්ගලයින්ට සැපයීම.

VII. ව්‍යාපාරික ස්ථානයේ හා එහි වටපිටාවේ ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් සපයන සේවා සඳහා ප්‍රමිතීන් සකස් කර ගැනීම මෙන්ම ඒජන්සි කාර්යාලයේ සේවකයන්ගේ හා කළමනාකරුවන්ගේ හැසිරීම පිළිබඳ වෘත්තීය ප්‍රමිතීන් සකස් කර ගැනීම. සෑම විටකම ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු සේවා සැපයිය යුතු ය.

VIII. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් පහසුකම් සපයන්නන්ට/ සිය බලපත්‍රය තාවකාලිකව පවරා දීම හෝ කාර්යාලීය පහසුකම් කුලියට දීම හෝ නොකළ යුතු ය.

IX. සෑම අවස්ථාවකදීම විවෘතව, විශ්වාසවන්තව හා ආචාරශීලීව රැකියා සොයන්නන්, කුලී සේවා සපයන්නන් හා අනෙකුත් අය සමග සාධාරණ ආකාරයෙන් කටයුතු කිරීම.

X. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරයකු විසින් ප්‍රවර්ධන කටයුතු සඳහා හෝ ව්‍යාපාරික කීර්තිය නංවා ගැනීම සඳහා හෝ වෙනත් ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරුන්ව මොනම ආකාරයකින්වත් අවමානයට ලක්කිරීමෙන්, විවේචනයන්, හෑල්ලු කිරීමෙන් හෝ අසාධාරණ ලෙස වාසියට හරවා ගැනීමෙන් වැළකීම.

XI. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ වැටුපෙන් හෝ වෙනත් ගාස්තු හෝ ගෙවීම්වලින් අයකිරීමක් නොකර පාලන අධිකාරිය විසින් නියමකර ඇති අවම අයකිරීම් සීමාවලට අවනත වීම.

XII. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් සිය ආයතනයේ කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා සහ සුදුසුකම් නොකඩවා වැඩි දියුණු කිරීමට වගබලා ගැනීම.

XIII. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විශේෂිතව දක්වා ඇති පරිදි බඳවා ගැනීමේ කටයුතු පිළිබඳ නියමාකාර සහ නිවැරදි වාර්තා ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් පවත්වා ගැනීම.

XIV. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙතින් විමසා අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ශ්‍රම වෙළඳපළ ප්‍රතිපත්ති පිළිබඳව ද්විපාර්ශ්වික ගිවිසුම්වලට නොඑළඹීම.

## 4. රැකියා පිළිබඳ වෙළෙඳ දැන්වීම්

I. රැකියා පිළිබඳ වෙළෙඳ දැන්වීම්වල අන්තර්ගතය සම්පූර්ණ නිරවද්‍ය, විශ්වාසදායක හා පැහැදිලි විය යුතු ය. සියලුම විස්තර හා හිමිකම් ප්‍රකාශනයන් හි සත්‍යාසත්‍යතාවය තහවුරු කර ගැනීමේ හැකියාව තිබීම අවශ්‍යය.

II. ඉදිරිපත් කරන රැකියා වර්ගවලට අවශ්‍ය වෘත්තීය සුදුසුකම්, සේවා තත්ත්වයන් සහ වැටුප්, රැකියා පිළිබඳ වෙළඳ දැන්වීම්වල ඇතුළත් විය යුතු ය.

III. සේවය කිරීමට සිදුවන රටෙහි අයිතිවාසිකම් වල යථාර්තය, ප්‍රතිලාභ, වැටුප්, බෝනස්, නවාතැන් පහසුකම් හෝ ජීවිත්වීමට සිදුවන පරිසරය ආදිය පිළිබඳව සැබෑ තත්ත්වය ඉක්ම වූ තොරතුරු මෙන්ම කොන්ත්‍රාත්තු පිළිබඳව සේවකයන්ගේ වගකීම හා බැඳීම සහ සේවය කරන රටෙහි සේවය කිරීමේදී සහ ජීවත්වීමේ දී මුහුණ පෑමට සිදුවිය හැකි අසීරුකම් / අභියෝග පිළිබඳව සැබෑ තත්ත්වයට වඩා අඩු තොරතුරු වෙළෙඳ දැන්වීමේ ඇතුළත් නොකිරීම.

IV. වෙළෙඳ දැන්වීමේ ඇතුළත් තොරතුරු සේවයේ යෙදීමට යෝජිත රටෙහි සේවා සහ ජීවන තත්ත්වයන් පිළිබඳව රැකියා සොයන්නන් නොමග යවන සුළු හෝ රවටන සුළු ඒවා නොවිය යුතු ය.

V. වෙළෙඳ දැන්වීමේ සඳහන් සියලුම විශේෂිත ඇබෑර්තු එය පළකරන/ප්‍රදර්ශනය කරන අවස්ථාව වන විට විදේශීය සේවා දායකයෙකු/අනුග්‍රාහකයෙකු විසින් අදාළ ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරයා වෙත වෙන් කර තිබිය යුතු වීම සහ ඒ සඳහා තෝරා ගන්නා අයට ලබාදිය හැකි වීම.

VI. ශ්‍රී ලංකාවෙහි හෝ ගමනාන්ත රටෙහි ජනයාගේ ආගමික හෝ ප්‍රජා වටිනාකම්වලට එරෙහි මොනම තොරතුරක් හෝ කරුණු වෙළෙඳ දැන්වීම්වල අඩංගු නොවිය යුතු ය.

VII. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් වෙළෙඳ දැන්වීම් සම්බන්ධව නිකුත් කරන මාර්ගෝපදේශ ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් අනුගමනය කළ යුතු ය.

## 5. බඳවා ගැනීම

I. විදේශ රැකියා ගනුදෙනුවලදී වංචා, වැරදි අර්ථකථන හා සදාචාරාත්මක නොවන ක්‍රියාමාර්ගවලින් කර්මාන්තය හා සිය සේවා දායකයන් ආරක්ෂා කර ගැනීම සඳහා ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් උත්සාහ ගත යුතු ය.

II. විදේශ සේවා නියුක්තිය සඳහා ළමා ශ්‍රමය භාවිතා කිරීම හෝ නොසැපයීම ගැන වග බලා ගැනීම සහ/හෝ මානව වෙළෙඳාම හා මානවයන්

හොරෙන් ප්‍රවාහනය හා සමාන ක්‍රියාකාරකම්වල නොයෙදීම වෙනුවෙන් ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් පියවර ගැනීම.

III. විදේශ රැකියා කර්මාන්තය ආරක්ෂා කර ගැනීමටත්, මානව වෙළෙඳාමෙන් සිය සේවාදායකයන් ආරක්ෂා කර ගැනීමටත් ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් උත්සාහ ගත යුතු අතර එම නීති විරෝධී ක්‍රියාවන්හි යෙදෙන්නවුන් විමර්ෂණය සහ නඩු පැවරීම සඳහා තම සම්පූර්ණ සහයෝගය දිය යුතු ය එසේම, මානව වෙළෙඳාම ශ්‍රී ලංකාවේ දණ්ඩ නිති සංග්‍රහයේ අඩංගු වරදක් බව ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් තම කාර්ය මණ්ඩල දැනුවත් කළ යුතු ය.

IV. ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙනස් කොට සැලකීම වැළැක්විය යුතු අතර, රැකියා සොයන කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා සම්බන්ධව ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් නිසි සැලකිල්ල යොමු කළ යුතුවා මෙන්ම සෑම අවස්ථාවකදීම රැකියා සොයන්නන්ගේ අභිමානය ආරක්ෂා කිරීමට වෑයම් කළ යුතු ය.

V. විවිධ රටවල ස්ථාපිත වයස් සීමාවන් ද, විවිධ රැකියා වර්ග සඳහා ශ්‍රී ලංකාව විසින් ස්ථාපිත වයස් සීමාවන් ද සිහියේ තබා ගනිමින් විදේශ රැකියාවල යෙදීමට සුදුසු වයසට වඩා අඩු බව පෙනෙන රැකියා සොයන්නන් ගැන ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් විමසිල්ලෙන් සිටිය යුතු ය. සැක සහිත විට සහ හඳුනාගැනීමේ ලියවිලි නොමැතිවිට ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්ත විසින් රැකියා සොයන්නාගේ වයස සහතික කෙරෙන වෛද්‍ය සහතිකයක් ඉල්ලා සිටිය යුතු ය.

VI. විදේශ රැකියා සඳහා තමන් විසින් බඳවා ගන්නා ශ්‍රමිකයින්ට රැකියා කොන්ත්‍රාත්තුවක් ලබාදීමට සහ ඊට අනුකූලව කටයුතු කිරීමට ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් වග බලාගත යුතු ය.

VII. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් රැකියා කොන්ත්‍රාත්වලට වෙනත් කොන්ත්‍රාත් ආදේශ කිරීමෙන් වැළකීම හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට එවැනි ආදේශ කිරීමක් වාර්තා වූ වහාම එය නිවැරදි කිරීමට වහා පියවර ගත යුතු ය.

VIII. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් අන්තරාදායක හෝ උවදුරු සහිත සේවා පරිසරයන්හි සේවයෙහි යෙදීමට සිදුවන අනවශ්‍ය / පිළිගත නොහැකි අවදානම් සහිත රැකියා සඳහා ශ්‍රමිකයින් බඳවා ගැනීමෙන් වැළකිය යුතු ය.

IX. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරයෙකු විසින් සපයනු ලබන ශ්‍රමිකයින් සම්බන්ධව ඔවුන්ගේ ස්වභාවය, විශ්වසනීයත්වය, මව්රට, සුදුසුකම්, සෞඛ්‍යමය සුදුසකම් ආදිය සම්බන්ධයෙන් සාවද්‍ය අර්ථකථන නො කළයුතු ය.

X. හැකි සෑම විටම ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් සෘජුවම බඳවා ගැනීම් කළ යුතු ය.

XI. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරයෙකු විසින් ශ්‍රමිකයින් බඳවා ගැනීමේ ක්‍රියාවලියට දේශීය වශයෙන් සහයෝගය දෙන්නන් සම්බන්ධ කර ගන්නා විට දී, එවැනි ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරයෙකු එකී සහයෝගය දෙන්නන්ගේ ක්‍රියාකාරකම් ගැන වගකීමට නීතියෙන් බැඳේ. එම සහයෝගය දෙන්නන් රටේ නීතිය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, පනත සහ සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයට අවනතවීම සහතික කරනු පිණිස ඔවුන්ට උපදෙස් දීම හා පාලනය අදාළ ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරයා විසින් කළ යුතු වේ.

XII. ඒජන්සිය විසින් සපයන සේවාව වෙනුවෙන් ශ්‍රමිකයින් ලබාගන්නා සියලු ගාස්තු හා වියදම් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නීති රෙගුලාසිවලට අනුව විය යුතු ය. රැකියා සොයන්නන් විසින් කරන ලද සියලුම ගෙවීම් වෙනුවෙන් ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරයා විසින් රිසිට්පත් නිකුත් කළ යුතු ය.

XIII. රැකියා සොයන්නන්ගෙන් ගාස්තු අය කරගැනීම සඳහා ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරුන් විසින් තමන් වෙනුවෙන් කටයුතු කිරීමට අතරමැදියන්ට ඉඩ නොදිය යුතු ය.

XIV. ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රමිකයින් යැවීමට අවසර නොදෙන රටවල් සඳහන් ලැයිස්තුවක් ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරුන් විසින් තම ව්‍යාපාරික ස්ථානයෙහි ප්‍රදර්ශනය කළ යුතු ය.

XV. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් රැකියාවලට ශ්‍රමිකයින් විදේශගත කිරීමට නෛතික හා ආරක්ෂිත මාර්ගයන් පමණක් භාවිතා කළ යුතු අතර, නිවාඩු සඳහා සංචාරය, ඥාතීන් බැලීමට යාම, ව්‍යාපාරික ගමන් ආදී වෙනත් මාර්ගයන් (සේවා නියුක්තිය සඳහා සේවකයන් යැවීමේ දී) භාවිතා නොකළ යුතු ය.

XVI. සේවා නියුක්ති කොන්ත්‍රාත්තුවක් අත්සන් කරන අවස්ථාවේ දී තර්ජනය කිරීම, බලකිරීම හෝ හිරිහැර කිරීම, වංචාව හෝ රැවටීම මගින් ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් ශ්‍රමිකයාව බිය නොවැද්දිය යුතු ය.

## 6. ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව හා සුභසාධනය

I. විදේශ රැකියා අවස්ථා ලබා ගැනීමෙහි නිරත ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්ත ආයතනවල මූලික යුතුකමක් විය යුත්තේ විදේශගත කරන ලද ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව හා සුභ සාධනය යි. එසේ හෙයින්, ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව හා සුභ සාධනය සහතික කර ගනු පිණිස ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්ත ආයතන විසින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට සහ විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යංශය, විදේශ කටයුතු අමාත්‍යංශය, සහ විදේශයන් හි ශ්‍රී ලංකා දූත කාර්යාලයන් ආදී රාජ්‍ය අංශයේ පාර්ශ්වකරුවන්ට හැකි සම්පූර්ණ සහයෝගය දිය යුතු ය.

II. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් තමන්ගේ අදාළ විදේශ ඒජන්සි හරහා විදේශ සේවා නියුක්තිය ලබාගත් ශ්‍රමිකයින්ගේ

සුභ සාධනය පිළිබඳ අඛණ්ඩ නියාමනයක නියැලිය යුතු ය.

III. විදේශීය අනුග්‍රාහකයා / සේවා යෝජකයා විසින් කොන්ත්‍රාත්තුව හරහා පැවරෙන වගකීම් ඉටු කරන්නේදැයි තහවුරු කර ගැනීම පිණිස සිය විදේශීය පූරකයන් (counterparts) සමග සමීප සම්බන්ධීකරණයක් ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් පවත්වා ගැනීම.

IV. විදේශීය සේවා යෝජකයෙකු හා රැකියාව සඳහා බඳවාගත් පුද්ගලයෙකු අතර ඇති කරගත් රැකියා කොන්ත්‍රාත්තුවක වගන්ති හා කොන්දේසි එම සේවා යෝජකයා විසින් ඉටු කරන්නේදැයි තහවුරු කර ගැනීම පිණිස සාධාරණ ලෙස ගත හැකි සියලු පියවරයන් ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරුන් විසින් සිය පූරකයන් මගින් ගත යුතු ය.

V. සේවා යෝජකයන් විසින් කොන්ත්‍රාත්තුව හරහා ඇති වගකීම් දැඩි සේ උල්ලංඝනය කිරීමක දී අදාළ ස්ථානයේදීම නිරාකරණය කර බලපෑමට ලක් වූ ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරනු පිණිස ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් පුද්ගලිකව සේවා යෝජකයා හමුවීම ධෛර්යමත් කරනු ලැබේ.

VI. සේවය සඳහා ශ්‍රමිකයින් යැවීමට නියමිත විදේශීය සමාගම්වල සංකාර්ය කටයුතු ආරක්ෂිත, අවදානමෙන් තොර, ශ්‍රමිකයින්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාවට හානිවීමට ඉඩ නැති බව ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් තහවුරු කර ගත යුතුවේ.

VII. කොන්ත්‍රාත්තුවේ වගන්ති, සේවයේ යෙදෙන රටෙහි නීතිය, චාරිත්‍ර චාරිත්‍ර හා සම්මතයන් පිළිබඳව විදේශීය සේවා නියුක්තිය සඳහා තෝරා ගත් ශ්‍රමිකයාව හොඳින් දැනුවත් කළ යුතු ය.

VIII. විදේශීය සේවා නියුක්තිය සඳහා තෝරාගත් ශ්‍රමිකයාව එම රටෙහි පවත්නා පැමිණිලි ඉදිරිපත් කිරීමේ යාන්ත්‍රණය ගැන දැනුවත් කළ යුතු ය.

IX. මරණය, අනතුරක්, පීඩාවක් හෝ දැඩි අපහරණය පිළිබඳව සිය විදේශීය පූරකයා, සේවායෝජකයා හෝ ශ්‍රමිකයා විසින් ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරුන්ට වාර්තා කළ කල්හි වැඩිදුර කටයුතු සඳහා එම තොරතුරු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය / විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කළ යුතු ය.

X. මොනයම්ම හෝ කරදරයකට මුහුණ දුන් ශ්‍රමිකයින්ට අත්සන් කර ඇති කොන්ත්‍රාත්තුව ප්‍රකාර ගමනාගමන පහසුකම්, ඖෂධ ආදිය සැපයීම වැනි සුභසාධන පහසුකම් සැලසීම මගින් ආපසු ඒමට පහසුකම් සැලසීමට ද, පිළිගැනීමට ද, ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් පියවර ගත යුතු ය.

XI. මොනයම්ම හෝ කරදරයකට පත්ව ආපසු එන ශ්‍රමිකයින් නැවත ප්‍රජාව හා සමෝධානය වීමට ආධාර කිරීම සඳහා අවශ්‍ය මනෝ-සමාජීය

උපදේශන සේවාවන් ලබාගැනීම සඳහා යොමු කිරීම ද, අවශ්‍ය නම් වැඩිදුර උදව් ලබා ගැනීමට අදාළ ආයතන වෙත යැවීමට ද ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් පියවර ගත යුතු ය.

XII. ළමා ශ්‍රමය ලබා ගැනීමට, බලයෙන් ශ්‍රමය ලබා ගැනීමට, නීති විරෝධී බඳවා ගැනීම්වලට, මානව වෙළඳාමට හා මානවයන් හොරෙන් ප්‍රවාහනයට එරෙහි ව ගන්නා පරිශ්‍රමයන්ට, උද්ඝෝෂණ ව්‍යාපාරවලට හෝ වැඩසටහන් වලට ආධාර කිරීම හා සහයෝගය දැක්වීම ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරුන් අතින් සියලු අවස්ථාවල දී ඉටුවිය යුතු ය.

XIII. සංක්‍රමණික ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ගේ අයිතිවාසිකම් විපතට හෙළන, බාධා කරන හෝ උල්ලංඝනය කරන ඕනෑම ක්‍රියාවක් ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් මගහැරිය යුතු වෙයි.

XIV. සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව හා සුභසාධනය ප්‍රවර්ධනය සඳහා වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ක්‍රියාකාරී සැලසුම් සමග සක්‍රීයව සහභාගිවීම, සහයෝගීව කටයුතු කිරීම සහ අන්‍යොන්‍යව උපකාරීවීම ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු අතින් ඉටුවිය යුතු ය.

XV. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් සංක්‍රමණික ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අයිතීන් හා සුභසාධනය ආරක්ෂා කරනු පිණිස ප්‍රකාශයට පත්කර ඇති ජාත්‍යන්තර නීතිමය ලියවිලිවලට ගරු කළ යුතුවාක් මෙන්ම ඒවා කෙරෙහි විශ්වාසය තබමින් පිළිපැදිය යුතු ය.

XVI. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් හඳුන්වා දී ඇති සංක්‍රමණික සේවකයන් සඳහා වූ සමාජ සුරක්ෂිතභාවය සහ රක්ෂණ වැඩ පිළිවෙළ සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගය හා උපකාරය දිය යුතු ය.

## 7. පුහුණුව

I. විදේශීය අනුග්‍රාහකයින් ගේ කොන්ත්‍රාත්තුවල ස්ථාපිත කර ඇති අවශ්‍යතා පරිදි සහ පාලන අධිකාරිය පැහැදිලිව දක්වා ඇති ප්‍රමිතීන්ට අනුව, ශ්‍රමිකයින් විදේශගත කිරීමට පෙර විදේශ භාෂා පාඨමාලා ද ඇතුළුව විශේෂ වෘත්තීය පුහුණු ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් සංවිධානය කළ යුතු ය.

II. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ භර සැකිල්ල යටතේ නියම කර ඇති පරිදි, ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් ශ්‍රමිකයින් පිටත් වීමට පෙර පුහුණු හා දිශානුයෝජන පුහුණු කිරීම සහ කොන්ත්‍රාත්තු හා ගමනාන්තය පිළිබඳව ප්‍රායෝගික තොරතුරු ශ්‍රමිකයින්ට ලබාදිය යුතු ය.

III. ආරක්ෂිත සංක්‍රමණය හා අක්‍රමවත් සංක්‍රමණයේ දුර්විපාක මෙන්ම මානව වෙළෙඳාම සහ හොරෙන් ප්‍රවාහනය කිරීමේ අනතුරු සහිත තත්ත්වය

පිළිබඳව රැකියා අපේක්ෂා කරන ශ්‍රමිකයින් දැනුවත් කිරීමේ වැඩ සටහන් සංවිධානය කිරීම හා පැවැත්වීම ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් සිදුකළ යුතු ය.

IV. තමන් සේවයට යාමට අපේක්ෂිත රටෙහි දී ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම්, වගකීම්, බැඳීම්, රැකියා ස්ථරයන් සහ කළ යුතු හා නොකළ යුතු දේ සම්බන්ධව සේවයට යාමට අපේක්ෂිත ශ්‍රමිකයින් දැනුවත් කිරීමට ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරු විසින් වගබලා ගත යුතු වේ.

V. ගෝලීය වශයෙන් ඇති පුහුණු ශ්‍රම හිඟය පිළිබඳව ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරුන් අවබෝධයෙන් සිටිය යුතුවා මෙන්ම, ඉහළ ඉල්ලුමක් ඇති විශේෂිත කුසලතා ගැන සංක්‍රමණික ශ්‍රමිකයින් වීමට ඉඩඇති අයවළුන් දැනුවත් කිරීම සහ එම විශේෂිත කුසලතාවලින් සන්නද්ධ වන ලෙස උනන්දු කරවීම ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්තවරුන් අතින් සිදුවිය යුතු ය.

## 8. පැමිණිලි ගැන කටයුතු කිරීම හා ආරාවුල් නිරාකරණය

I. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් හෝ ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සියෙහි සේවකයන් විසින් සපයනු ලබන කාර්යයන් හෝ සේවා පිළිබඳව යමෙකු පැමිණිල්ලක් කළහොත් ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් ඊට වහාම ප්‍රතිචාර දැක්විය යුතුය. රැකියා අපේක්ෂා කරන කාන්තාවක් විසින් පැමිණිල්ල කරන්නේ නම්, ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් යොදාගන්නා පැමිණිලි විමර්ෂණ / සමාලෝචන කණ්ඩායමට කාන්තාවක් ඇතුළත් විය යුතු ය.

II. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය හෝ එහි සේවකයන් විසින් සපයනු ලැබූ කාර්යයන් හෝ සේවා පිළිබඳව හෝ මෙම සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයට ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය අවනත වීම පිළිබඳ ඕනෑම කාරණයකට අදාළව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත කරන ලද පැමිණිල්ලක විස්තර පාලන අධිකාරිය විසින් ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය වෙත ලබාදුන හොත්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විශේෂිතව දක්වා ඇති කාල සීමාව තුළ ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් නියමාකාරයට ප්‍රතිචාර දැක්විය යුතු ය.

III. සේවයේ යෙදෙන රටෙහි නීතිවලට සහ ශ්‍රී ලංකා රජය හා සේවය කරන රට අතර අත්සන් කර ඇති ඕනෑම ද්විපාර්ශ්වික ගිවිසුමකට අවනත වෙමින්, ශ්‍රමිකයින් හා විදේශීය සේවා යෝජකයන් අතර ඇතිවන සියලුම ආරාවුල් අදාළ පාර්ශ්ව අතර අත්සන් කර ඇති ගිවිසුම පදනම් කරගෙන විසඳිය යුතු ය.

IV. සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ දුක් ගැනවිලි නිරාකරණයෙහිලා ශ්‍රී ලංකා විදේශ සේවා

නියුක්ති කාර්යාංශය සහ අදාළ රාජ්‍ය අංශයේ පාර්ශ්වයන් සමග සම්පූර්ණ සහයෝගයෙන් ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය කටයුතු කළ යුතු ය.

V. සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ පැමිණිලි විසඳීමෙහි දී විදේශීය පූරක / සම්බන්ධීකාරකගේ සම්බන්ධීකරණය සහිතව අප්‍රමාදව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමෙහි ලා ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් අවධානය යොමු කළ යුතු ය.

VI. ශ්‍රමිකයා වෙත පිරිනමන ලද සේවා කොන්ත්‍රාත්තුවේ සඳහන් කර ඇති වගන්ති හා කොන්දේසි සේවා යෝජකයා විසින් නියමාකාරයෙන් පිළිපැදීමේ මට්ටම තැංවීමට ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් කටයුතු කළ යුතු ය.

VII. සේවා යෝජකයා විසින් ශ්‍රමිකයෙකුට නොගෙවූ වැටුප් ලබාගැනීම සඳහා ඇති සියලුම හැකියාවන් ගැන ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් සොයා බැලිය යුතු ය.

VIII. සේවය කරන රටෙහි දේශපාලන / ආර්ථික / හෝ වෙනත් ඕනෑම හදිසි අවස්ථාවක් හේතුවෙන් ශ්‍රමිකයන් ආපසු හරවා එවීමට සිදුවුවහොත් ඒ සඳහා අධිකාරීන්ට අවශ්‍ය සහාය ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් සැපයිය යුතු ය.

IX. සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ දුක් ගැනවිලි සම්බන්ධව පවුලේ සාමාජිකයන් කරන විමසීම් වලට ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් කාලෝචිත හා සත්‍ය තොරතුරු සැපයිය යුතු ය.

X. යුතුකම් පැහැර හරින විදේශීය රැකියා ඒජන්තවරු / සේවා යෝජකයන් / අනුග්‍රාහකයන් / සම්බන්ධ දත්ත එකතුවක් ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් පවත්වා ගෙන යා යුතු අතර, එම තොරතුරු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා එම දත්ත සෙසු රැකියා ඒජන්ත වරුන්ටත් ලබා දිය යුතු ය.

## 9. සේවා දායකයන්ට හා රැකියා සොයන්නන්ට ඇති වගකීම සහ පාරිභෝගික සත්කාරය

I. මහජනයා ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සි කාර්යාලයයට පැමිණෙන විට හෝ වෙනත් මොනම ආකාරයකින් (දුරකථන / ෆැක්ස් / විද්‍යුත් තැපෑල /ලිපි ආදී) හෝ විමසීම් කරන විට ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් උචිත පාරිභෝගික සත්කාර ප්‍රතිපත්ති පිළිපදිමින් කටයුතු කළ යුතු ය.

II. පාරිභෝගිකයන්ට මිත්‍රශීලී වාතාවරණයක් පවතින අයුරින් ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සි කාර්යාලය පවත්වා ගත යුතු ය.

III. මහජන සම්බන්ධතා සහ රැකියා සොයන්නන් සමග ආචාරශීලී ලෙස කටයුතු කිරීම සඳහා ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් සිය කාර්ය මණ්ඩල සාමාජිකයන්ට පුහුණුව ලබා දිය යුතු අතර කාන්තාවන්ට විශේෂ අවධානය යොමු කරමින් රැකියා සොයන්නන්ගේ පුද්ගලිකත්වය ආරක්ෂා කිරීමට සෑහෙන ක්‍රියාමාර්ගයන් ගත

යුතු ය.

IV. නෛතික අවශ්‍යතාවයන්හි දී සැපයිය යුතු දත්තයන් හැර සෙසු සියලු අවස්ථාවල දී විදේශ රැකියා අවස්ථා සොයන්නකුගේ / සේවා දායකයෙකුගේ පුද්ගලික දත්තයන්වල රහස්‍යභාවය ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් පවත්වා ගත යුතු ය.

V. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් රැකියා අවස්ථා සොයන්නකුගේ දැනට පවත්නා හෝ අනාගත රැකියා අවස්ථා අසාධාරණ ලෙස උවදුරට ලක් කෙරෙන මොනම ක්‍රියාවකවත් යෙදීමෙන් වැළකිය යුතු අතර, වෘත්තීය සංවර්ධනය සඳහා සිය ධාරිතාව උපරිම කර ගැනීමට රැකියා සොයන්නෙකුට ඇති අයිතිය තහවුරු කළ යුතු ය.

VI. පාරිභෝගිකයන් විසින් පහසුවෙන් ලබාගනු පිණිස අධ්‍යාපනික හා දැනුවත්භාවය නංවන පත්‍රිකා ආදී දේ තම ව්‍යාපාරික ස්ථානයෙහි සපයා තැබීමට ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් පියවර ගත යුතු ය. අවශ්‍ය කල්හි හෝ ඉල්ලා සිටි කල්හි සේවාදායකයන්ට භාෂා පරිවර්තන සේවය ලබාදීමට ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය කටයුතු කළ යුතු ය.

VII. රැකියා ඇබෑර්තු ගැන රැකියා අවස්ථා සොයන්නන් කරන විමසීම්වලට ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් පවත්නා ශ්‍රම වෙළෙඳපළ තොරතුරු ඇතුළු රැකියා සහ ස්ථාපන විකල්පයන් ගැන නිවැරදි උපදෙස් සැපයිය යුතු ය.

VIII. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් රැකියා සොයන්නෙකු විසින් සපයන ලද තොරතුරු රැකියා සඳහා තෝරා ගැනීම හැර වෙනත් අරමුණක් සඳහා භාවිතා කිරීමෙන් වැළකිය යුතු ය.

## 10. හවුල් ගොඩනැගීම

I. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය සහ විදේශීය බඳවා ගැනීමේ කණ්ඩායම් අතර සම්බන්ධතාවය.

(අ). ව්‍යාපාරික හවුල්කරුවන් සමග රැකියා ඒජන්තවරියක / වරයෙකු එක්ව කටයුතු කළ යුතු අතර අන්‍යෝන්‍ය සහයෝගය තිබිය යුතු ය.

(ආ). ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සියක් තරඟකරුවන් කෙරෙහි සාධාරණ විය යුතු අතර, ශ්‍රමිකයින් මත බර පැටවීමට ඉඩ තිබෙන හෙයින් ගිවිසගත් මට්ටමට වඩා වැඩි මිලක් ගෙවීමෙන් කොන්ත්‍රාත් සහ හවුල්කරුවන් දිනා ගැනීමෙන් වැළකිය යුතු ය.

(ඇ). සෙසු ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සි සමග ගනුදෙනු කරන විට දී ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සියක් සාධාරණව, අවංකව හා ආචාරශීලීව කටයුතු කළ යුතු ය.

II. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා සෙසු අදාළ රාජ්‍ය ආයතන සමග සම්බන්ධතාවය

(අ). පාලන අධිකාරිය විසින් විශේෂිතව දක්වන කාල සීමාව තුළ, පාලන අධිකාරිය ඉල්ලා සිටින / විමසීම් කරන තොරතුරු සඳහා ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් ප්‍රතිචාර දැක්විය යුතු ය.

## 11. ආපසු පැමිණීම හා නැවත ප්‍රජාවට එකතු වීම (ප්‍රතිසංකලනය)

I. වෘත්තීය සංවර්ධනය සඳහා මගපෙන්වීම / උපදෙස් සැපයීම සහ ආපසු පැමිණීමට හා නැවත ප්‍රජාවට එකතු වීමට උපකාර ලබාගැනීම සඳහා අදාළ ඒජන්සි වෙතට යොමු කිරීමේ අරමුණින් ශ්‍රමිකයින් හා ඔවුන්ගේ කොන්ත්‍රාත් අවසාන වූ දිනයන් හා පිළිබඳ වාර්තා ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් නඩත්තු කළ යුතු ය.

II. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සි විසින් සංක්‍රමණික ශ්‍රමිකයන්ට නැවත ප්‍රජාවට එකතුවීම සම්බන්ධව උපදෙස් හා මාර්ගෝපදේශකත්වය සැපයිය යුතු ය. ආපසු පැමිණීමෙන් පසු අර්ථවත් ආයෝජන කරන ආකාරය ගැන ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සි විසින් සංක්‍රමණික ශ්‍රමිකයන්ට අවස්ථාවෝචිත උපදෙස් සැපයිය යුතු ය.

## 12. සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය ගැන දැනුවත් වීම

I. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් සිය වෙබ් අඩවියේ සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රදර්ශනය කළ යුතු අතර, ඊට එකතු වෙන සංශෝධන ඇතුළත් කරමින් එය යථාවත් කළ යුතු ය.

II. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සකස් කළ සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයෙහි පිටපතක් හොඳින් පෙනෙන සේ ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය විසින් සිය කාර්යාලයන්හි පහත සඳහන් ස්ථානවල ප්‍රදර්ශනය කළ යුතු ය.

(අ). සේවා දායකයන් විසින් භාවිතාවට ගන්නා නැවතීම් ශාලාවක් ඇත්නම් එම ස්ථානයේ,

(ආ). සේවාදායකයන් සමග ව්‍යාපාරික කටයුතු සිදුකරන / සාකච්ඡා පවත්වන කාර්යාලය හෝ කාමරය තුළ

III. සේවා දායකයෙකු ඉල්ලූ විට සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයෙහි පිටපතක් ලබාදීමට තරම් රැකියා ඒජන්තවරයා ආචාරශීලී විය යුතු ය.

## 13. සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක කිරීම

I. සිය සාමාජිකයන් අතර සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක කිරීමේ හුදු වගකීම ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සි සංගමය විසින් ඉසිලිය යුතු ය.

II. සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය උල්ලංඝණය කරන ඕනෑම ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සියක් ගැන ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සි සංගමයට පැමිණිලි කළ හැක. සියලු පැමිණිලි සංගමයේ ගොනු කළ යුතු ය.

III. සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය උල්ලංඝනය කරන ඕනෑම බලපත්‍රලාභියෙකු අමතා දින 14 ඇතුළත පැමිණිල්ල / ආරාවුල විසඳන ලෙස ඉල්ලා සිටිය යුතු අතර, එසේ කිරීමට අසමත් වුවහොත් ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සි සංගමය විසින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත පැමිණිල්ල යොමු කළ යුතු ය. එවැනි යොමු කිරීම් සම්මත ආකෘතියට අනුව සකස් කළ යුතු ය.

IV. ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සි සංගමය විසින් යොමු කළ පැමිණිල්ල සම්බන්ධව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් පරීක්ෂණයක් පැවැත්විය හැක. මේ සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් කමිටුවක් පත් කරනු ඇත. එවැනි පැමිණිලි සැලකිල්ලට ගත යුත්තේ සමථකරණ අංශය / බලාත්මක කිරීමේ අංශය විසින් ද, එසේ නැතහොත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් පත්කළ කමිටුව විසින් ද යන්න ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ බලයලත් නිලධාරියෙකු විසින් තිරණය කළ යුතු ය.

V. කමිටුව විසින් සොයාගත් කරුණු ගොනුකර තැබීම සඳහා ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සි සංගමයට යැවිය යුතු ය.

VI. විමර්ශන කමිටුව විසින් සොයාගත් කරුණුවලින් ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය බැඳීමකට යටත් වන අතර එම කරුණුවලින් පැනවෙන නියෝගය ගැන ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සිය සෑහීමකට පත් නොවන්නේ නම් ස්වාධීන විමර්ශනයක් පතමින් විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැක. එසේ නැතහොත් නීතියේ පිහිට සෙවිය හැක.

## 14. බලය පැවැත්වීම

I. කුමන හෝ ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සියක් විසින් සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය උල්ලංඝනය කර ඇත්නම් සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය විසින් පහත සඳහන් ආකාරයට කටයුතු කරනු ඇත.

(ඈ). ලිඛිතව අනතුරු ඇඟවීම

(ආ). පැමිණිල්ලේ ස්වභාවය මත චූදිත ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සියෙහි තරු ශ්‍රේණිය පහත දැමිය හැකි අතර එය අනාගත ශ්‍රේණිගත කිරීම්වලට බලපානු ඇත.

(ඇ). බලපත්‍රය අලුත් කිරීම තාවකාලිකව අත්හිටුවන ලෙස පාලන අධිකාරියට නිර්දේශ කළ හැක.

(ඈ). බඳවා ගැනීමේ බලපත්‍රය ආපසු ගන්නා ලෙස හෝ අවලංගු කරන ලෙස කමිටුව විසින් පාලන අධිකාරිය වෙත නිර්දේශ කළ හැක.

## 15. පැමිණිලි ඉදිරිපත් කිරීමේ කාල සීමාව

I. සදාචාරාත්මක චර්යා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය උල්ලංඝනය කිරීම ගැන දැනගෙන මාස තුනක් ඇතුළත ලියාපදිංචි බඳවා ගැනීමේ ඒජන්සි සංගමයට පැමිණිල්ල ඉදිරිපත් කළ හැක.

II. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හෝ වෙනත් මොනම හෝ පිළිගත් මාර්ගයකින්, රැකියා සොයායන්නන්ගෙන්, සේවාදායකයින් ගෙන් හෝ අනෙක් බලපත්‍රලාභීන්ගෙන් ලැබෙන පැමිණිලි සියලු කල්හිම කමිටුව විසින් කරන විමර්ශනයට පාත්‍ර වේ.

ශ්‍රමික සංක්‍රමණයේ යහපාලනය, ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව හා බලගැන්වීම තුළින් උචිත රැකියා ප්‍රවර්ධනය සඳහා සංක්‍රමික ශ්‍රමිකයින්ගේ ජාතික ප්‍රතිපත්තිය දියත් කිරීමේ ව්‍යාපෘතිය මගින් සකස් කරන ලදී.


ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකාව සහ මාලදිවයින
සඳහා වූ කාර්යාලය
202-204, බෞද්ධාලෝක මාවත
කොළඹ 7 ශ්‍රී ලංකාව
දුරකථන : +94 11 259 2525
ෆැක්ස් : +94 11 250 0865
www.ilo.org/colombo



අනුග්‍රහය

Schweizerische Eidgenossenschaft
Confédération suisse
Confederazione Svizzera
Confederaziun svizra

**Swiss Agency for Development and Cooperation SDC**